කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021

2024 නොවැම්බර්/දෙසැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

# බෞද්ධ සංස්කෘතිය

(අධ්‍යයන වර්ෂ 2007 සිට 2016 දක්වා)

## බෞද්ධ මූලාශ්‍රය හා සාහිත්‍යය අධ්‍යයනය BUCU– E1025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. දීඝනිකායේ මහාපරිනිබ්බාණ සූත්‍රයේ අන්තර්ගතය ඇසුරින් බුදුසිරිතෙන් ප්‍රකට වන මානුෂීය ගුණාංග පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

02. දරිද්‍රතාව මුල්කරගත් සමාජ අර්බුද විසඳීමෙහිලා රජයේ වගකීම කෙසේ විය යුතුදැයි දීඝනිකායේ කූටදන්ත සූත්‍රය ඇසුරින් විභාග කරන්න.

03. සිගාලෝවාද සූත්‍රාගත ස්වාමි-භාර්යා යුතුකම් හා වගකීම් පවුල් සංස්ථාවේ සාර්ථකත්වය පිණිස ඉවහල් වන අයුරු සකාරණව පහදන්න.

04. ස්ත්‍රීත්වය පිළිබඳ සාම්ප්‍රදායික භාරතීය සමාජ දෘෂ්ටියේ සාවද්‍යතාව තහවුරු කිරීමෙහි ලා බුදුරදුන් වදාළ යථාර්ථවාදී දේශනාව කෝසල සංයුත්තාගත ධීතු සූත්‍රය ඇසුරින් විමර්ශනය කරන්න.

05. භික්ෂුත්වයේ පරමාර්ථය පරිපූර්ණබවට පත් කිරීමෙහි ලා සේඛියා ධර්මයන්හි උපයෝගීතාව කෙතෙක්දැයි පරීක්ෂා කරන්න.

06. ශ්‍රී ලාංකේය සමාජය තුළ බෞද්ධ සංස්කෘතියේ අනන්‍යතාව තහවුරු කිරීමෙහි ලා ජාතක කථාවන්ගෙන් වූ මෙහෙය ප්‍රමාණ කරන්න.

07. මහාකාව්‍ය රීතියට අනුගතවෙමින් බෞද්ධ සංස්කෘතික සංකල්ප සමාජයට සම්ප්‍රේෂණය කිරීමෙහි ලා කාව්‍යශේඛර කතුවරයා තුළ පැවති පටුත්වය ප්‍රකට කරන්න.

08. ශ්‍රී ලාංකේය ජාතිය සතු උරුමය ජනගත කිරීමෙහි ලා වංසකථාවන්ගෙන් වූ මෙහෙය සනිදර්ශනව පැහැදිලි කරන්න.

09. බුදුගුණ අරබයා පුහුදීජන සන්තානයේ ප්‍රසාද සංවේගාත්මක ආකල්ප ප්‍රවර්ධනයෙහි ලා බුත්සරණ කතුවරයාට විෂය වූ වර්ණනා චාතුර්යය දමන කථා ඇසුරින් අගයන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට ප්‍රමාණවත් විවරණ සපයන්න.
    - i. ලෝවැඩසඟරාව
    - ii. සක්කපඤ්හ සූත්‍රය
    - iii. අරියපරියේසන සූත්‍රය
    - iv. බුදුගුණාලංකාරය

******************************